# රාජකීය විද්‍යාලය - කොළඹ 07
## මධ්‍ය වාර පරීක්ෂණය - 2011
## කෘෂි හා ආහාර තාක්ෂණය II - 10 ශ්‍රේණිය

**කාලය පැය 02**

පළමුවන ප්‍රශ්න ඇතුළු පහකට පිළිතුරු ලියන්න.

(01) සිරිපාල ගොවිමහතෙකි ඔහු වගා ප්‍රදේශයේ දේශගුණය පිළිබඳව මහා අවබෝධයකින් පසුවන්නෙකි. උචිත බෝග වර්ග තේරීම සහ උපරිම අස්වැන්නක් ලබා ගැනීමට ඔහු නිතර වෙහෙසෙයි.

1. බෝග වගාව කෙරෙහි බලපාන දේශගුණික සාධක මොනවාද?
2. මෙම පරිසරයේ විවිධ උෂ්ණත්ව කලාප ඇතිවිමට හේතු මොනවාද?
3. වගා බිමට ජලය ලැබෙන ප්‍රධාන ක්‍රමය කුමක්ද? එය මැනීමට භාවිතා කරන උපකරණය ඇද නම් කරන්න.
4. මෙහි පස ආම්ලික බව පවසයි එය මග හරවා ගැනීමට යොදන ද්‍රව්‍ය 2 ක් ලියන්න.
5. මෙහි බිම් සකස් කිරිමේ අරමුණු 3 ක් ලියන්න.
6. බිම් සකස් කිරිමට ගන්නා උපකරණ 5 ක් ලියන්න.
7. පසේ ඇති සංඝටක මොනවාද?
8. මෙම ප්‍රදේශයේ ඇති කෘෂි සම්පත් 2 ක් ලියන්න.
9. ප්‍රධාන වගා කන්න මොනවාද? එයට අයත් කාලය ලියන්න.
10. මෙම ප්‍රදේශයේ හිරුඑළිය පවතින කාල සීමාව මැනීමට අවශ්‍යය. ඒ සඳහා සිරිපාල භාවිතා කළ උපකරණය කුමක්ද?

(02) 1. තවානක් දැමීමෙන් ඇතිවන වාසි හතරක් ලියන්න.
2. තවාන් දැමීමට ස්ථානයක් තෝරා ගැනීමේදී සලකා බලන කරුණු මොනවාද?
3. ඔබ දන්නා තවාන් වර්ග 3 ක් ලියන්න.
4. ඉන් එක් තවාන් වර්ගයක් සාදාගන්නා ක්‍රමය ලියන්න.

(03) 1. පාංශු පැතිකඩක් යනු කුමක්ද? එහි රූපසටහනක් ඇද නම් කරන්න
2. ඒ එක් එක් ස්ථරය පිළිබඳව කරුණු 3 බැගින් ලියන්න.
3. පාංශු සංරක්ෂණ ක්‍රම 3 ක් ලියන්න.
4. ප්‍රධාන පාෂාණ වර්ග මොනවාද? උදා හරණ දෙන්න

(04) වී, මුං ඇට, කරවිල, මිරිස්, තක්කාලි, බණ්ඩක්කා, පුවක්, කපු, අබ, ගෝවා යනාදිය තුලින් තෝරා පිළිතුරු ලියන්න.

1. සොලනේසි කුලයට අයත් බෝග වර්ග 2 ක් ලියන්න.
2. තන්තු මුල් පද්ධතියක් ඇති ශාක වර්ග දෙකක් ලියන්න.
3. මැල්වේසි කුලයට අයත් බෝග වර්ග 2 ක් ලියන්න.
4. වියලි කලාපයේ වවන බෝග වර්ග 2 ක් ලියන්න.
5. කෘසිපරේසි කුලයට අයත් බෝග වර්ග 2 ක් ලියන්න.
6. ඒක බීජ පත්‍රී ශාක වර්ග දෙකක් ලියන්න.
7. පළතුරක් ලෙස භාවිතා කරන එළවළු බෝගයක් ලියන්න.
8. කර්මාන්තයක් සඳහා යොදා ගත හැකි බෝගයක් ලියන්න.

(05) 1. ඔබ දන්නා වර්ධක ප්‍රචාරණ ක්‍රම ලියන්න.
2. වර්ධක ප්‍රචාරණයේදී ග්‍රාහකයන් තෝරා ගැනීමේදී තිබිය යුතු ලක්‍ෂණ 4 ක් ලියන්න.
3. අනුජය මව් ශාකයේ තිබියදීම මුල් අද්දවා ගන්නා ක්‍රමය උදාහරණයක් සහිතව පහදන්න.
4. රූපය අඳින්න. කොටස් නම් කරන්න.

(06) 1. බීජ සුප්තතාවය යනු කුමක්ද?
2. බීජ සුපතතාවයට බලපත්‍ර බලපාන කරුණු 4 ලියන්න.
3. මෙය ඉවත් කරගන්නා ක්‍රම 2 ක් උදාහරණ සහිතව ලියන්න.
4. ප්‍රධාන බීජ ප්‍රරෝහණ ක්‍රම 2 ලියා උදාහරණ දෙන්න.

(07) 1. මූලික බිම් සැකසීමේ උපකරණ 3 ක් නම් කරන්න.
2. අතුරුයත් ගෑම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
3. අතුරුයක් ගෑමේදී සිදුකරන කාර්යයන් 2 ක් ලියන්න.
4. යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන බිම් සැකසීමේ උපකරණ 2 ක් ලියන්න.